# ලංසු සඳහා ආරාධනයයි.
# ප්‍රධාන අමාත්‍යංශය.
# සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කාර්යය සඳහා සුදුසුකම්ලත් සහ සුදුසුතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ මුද්‍රා තැබූ ලංසු සඳහා ආරාධනා කරනු ලැබේ.

මෙයට අදාළ සම්පූර්ණ කරන ලද ලංසු ලේඛණ 2011.07.19 වන දින ප.ව. 2.00 දක්වා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිළ කාමරයේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට බහාලන්න.

| අනු අංකය | විධායක ඉංජිනේරු කොට්ඨාශය | වැඩ විස්තරය | මූල්‍ය ප්‍රභවය | ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රුපියල්) | ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කරයේ ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 1 | ඇඹිලිපිටිය | අවසන් අපහරණ භූමිය හා කොම්පෝස්ට් අංගනය (පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථානය) වැඩිදියුණු කිරීම - ඇඹිලිපිටිය නගර සභාව | පළාත් පාලන අමාත්‍යංශය | M 7 / C 8 හෝ ඊට වැඩි | 2,000.00 | 42,000.00 (2011.07.19 සිට 2011.11.19 දක්වා) |

01. සබරගමුව පළාත් සභාවේ හෝ ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ ( ICTAD ) ගොඩනැගිලි විෂයය යටතේ ඉහත සඳහන් ලියාපදිංචි ශ්‍රේණියට හෝ ඊට වැඩි වටිනාකමකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ලංසු අයදුම් කිරීමට සුදුස්සෝ වේ.

02. 2011.06.27 වන දින සිට 2011.07.18 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවනු ලබන ගාස්තු ගෙවා රත්නපුර, නව නගරයේ පිහිටි සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී අදාළ ලංසුපත් ලබාගත හැකිය.

03. සියළුම ලංසුකරුවන් ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුකූලව ඉහත වගුවේ සඳහන් වැඩ විෂයට අදාල වටිනාකමට (ආපසු ගෙවනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බැංකුවකින් **"ලේකම්, ප්‍රධාන අමාත්‍යංශය, සබරගමුව පළාත් සභාව"** නමට ලබාගත් ලංසු බැඳුම්කරයක් හෝ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයට මුදල් තැන්පත් කර, ලබාගත් ලියවිලිවල මුල්පිටපත් සෙසු ලංසු ලේඛණවල මුල්පිටපත් සමග ඉදිරිපත් කළ යුතුයි.

04. එසේම, ලංසු ලේඛණ බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල කර්මාන්තයේ නම සඳහන් කළ යුතුයි.

05. ලංසු ලේඛණ ලබා ගැනීමට පළාත් සභා කොන්ත්‍රාත් ලියාපදිංචි පොත / ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ කොන්ත්‍රාත් ලියාපදිංචි පොත (ICTAD ලියාපදිංචිය), ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළයුතු වේ.

06. උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලසුකරුවන්ට සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී අදාළ ලංසු ලේඛණ කාර්යාල වේලාවන් තුළ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ. මේ සඳහා ගාස්තු අය කිරීමක් නොකෙරේ.

07. කොන්ත්‍රාත් ලියාපදිංචියේ වලංගු භාවය තහවුරු කර ගැනීමට කටයුතු කරනු ලබන අතර, ලියාපදිංචිය වලංගු නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ඉදිරිපත් කරනු ලබන ලංසුව ලංසු විවෘත කරන දින සිට දින 90 ක් වලංගු විය යුතු අතර ලංසු බැඳුම්කරය දින 120 වලංගු වියයුතු වේ.

09. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කෙරෙනු ඇත. එමෙන්ම, සාර්ථක ලංසුකරු අසාධු ලේඛණගත වූවකු නොවිය යුතුය. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාරගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

10. අදාළ ලංසු 2011.07.19 වන දින ප.ව. 2.00 දක්වා පමණක් රත්නපුර, නව නගරයේ, සබරගමුව පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිළ කාමරයේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත බහාලන්න. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. 2011.07.19 වන දින ප.ව. 2.15 ට පමණ (ලංසු භාරගෙන අවසන් වූ වහාම) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී එහි පැමිණි ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලබනවා ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

12. ඉහත වැඩවිෂයන්ට අදාල ඇස්තමේන්තුගත වැඩ වටිනාකම ටෙන්ඩර්පත් නිකුත්කරන ලද අවස්ථාවේදී ලබාගත හැක.

13. මෙම දැන්වීම අන්තර්ජාලයේ www.sg.gov.lk යන ලිපිනයෙන් ද ලබාගත හැකිය.

ලේකම් / සභාපති,
ප්‍රධාන අමාත්‍යාංශය.
ප්‍රසම්පාදන කමිටුව,
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.
2011.06. 23 වන දින ප්‍රධාන අමාත්‍යාංශයේ දී.

විමසීම් : සහකාර ලේකම්, (සංවර්ධන)
045 – 2222204
ප්‍රධාන අමාත්‍යාංශය,